ග්‍රිගෝර් ඔස්තෙර්

නිවුන්නු හපන්නු

පරිවර්තනය

එච්. ජයරත්න




1
3
+
5
4
?
8
6
=
?
9
×
2
7
0
?
−



ග්‍රිගෝරි ඔස්තෙර්

නිවුන්නු හපන්නු

පරිවර්තනය

එච්. ජයරත්න

කුරුළු පොත්

594/1, නාවල පාර, රාජගිරිය

දු.ක. 2863350/071-8263828



මේ පින්තූරයේ ඔබට
දැස් කියක් පෙනෙනවාද?

එකෝමත් එක රටක නිවුන්නු දෙන්නෙක් හිටියා. දවසක් මේ නිවුන්නු දෙන්නට මදුරුවෝ එළව එළවා විද්දා. වැඩිමල් නිවුන්නා අත්පුඩි ගහලා මදුරුවෝ පස් දෙනෙක් මැරුවා. බාල නිවුන්නා අයියාගේ ඇඟට අල්ලෙන් ගහලා හත් දෙනෙක් මැරුවා. මේ සටනේදී මදුරුවෝ කී දෙනෙක් මැරුණාද?


ඔබට මේ පින්තූරයේ
සපත්තු ජෝඩු කියක් පෙනෙනවාද?

නිවුන්නු දෙන්නා ළඟ ලොලිපොප් හයක් තිබුණා. අයියා
නිවී සැනසිල්ලෙ ලොලිපොප් දෙකක් උර උර ඉන්න අතරේ
මල්ලි ඉතිරි ඔක්කෝම ටික ගිල දැම්මා.
මල්ලිට වඩා කීයක් අයියට අඩු වුණාද?



විනාඩි දෙකකදී නිවුන්නු දෙන්නට
කේක් කැබලි අටක් කන්න පුළුවන්.
එක විනාඩියකදී එක නිවුන්නකුට
කේක් කැබලි කීයක් කන්න පුළුවන්ද?


නිවුන්නො දෙන්නට
ඉදුණු දං ගෙඩි
සංග්‍රහයක් ලැබුණා.
එක නිවුන්නෙක්
කෑදරකමට දං ඇට
තුනකුත් ගිල්ලා. දෙවැනි
නිවුන්නා පළමු වෙනියට
වඩා දෙගුණයක් දං
ඇට ගිල්ලා. දැන්
නිවුන්නො දෙන්නගෙ
බඩවල් ඇතුළෙ දං ඇට
කියක් තියෙනවාද?
නොකා ඉතිරි වූ
දං ගෙඩි කීයක් මෙහි තිබේදැයි
සොයා බලන්න.

මේ පින්තූරයේ සතුන් කී දෙනෙක්
ඔබට පෙනෙනවාද?



නිවුන්නො දෙන්නා හැමදාම වැටේ එකම තැනකින් පනින්න පුරුදු වෙලා හිටියා. එක නිවුනෙක් හත් වතාවක් වැටෙන් පැන්නා. දෙවැනියා ඒ වගේ තුන් ගුණයයි. දෙවැනි නිවුන්නා කී වතාවක් වැටෙන් පැන්නාද?



නිවුන්නො දෙන්නා ගහට නැගලා වෙරළු කැඩුවා. පළමු නිවුන්නා වෙරළු ගෙඩි හතක් කැඩුවට පස්සෙ අත්තත් කඩාගෙන බිමට වැටුණා. දෙවැනියා බිමට වැටෙන්න කලින් වෙරළු ගෙඩි තුනක් කඩා ගත්තා. කඩා ගත්ත වෙරළු දෙන්නා අතරෙ සමව බෙදා ගත්තොත් එක් කෙනෙකුට කීයක් ලැබෙනවාද?

නිවුන්නන්ට කලින් වෙරළු ගෙඩි කීයක් බිමට වැටී තිබේදැයි ගණන් කර බලන්න.


මේ පින්තූරයේ ඔබට
බොක්සිං අත්වැසුම්
කීයක් පෙනෙනවාද?
MAIK TISON
SPORT

නිවුන්නු දෙන්නා බොක්සිං ගහ ගත්තා. දෙන්නටම නිල් වෙන්න වැදුණා. අයියා ඉස්සෙල්ලා මල්ලිට හතර පොළකට නිල් වෙන්න ගැහුවා. ඊට පස්සෙ තවත් පාරක් නිල් වෙන්න ගැහුවා. මල්ලි අයියාට පළමුව දෙපාරකුයි, ඊට පස්සෙ තුන්පාරකුයි නිල්වෙන්න ගැහුවා. දෙන්නගෙම නිල් පාට වුණේ එකම තැන්වල නම් දෙන්නාගෙම පෙනුම එක සමානද?





නිවුන්නු දෙන්නා බෝල ගහන්න ගිහින් ජනේලයක් බින්දා. ඒකට අයියා කනේ පාරවල් තුනක් කෑවා. මල්ලි කනේ පාරවල් දෙකයි. එතකොට දෙන්නම කනේ පාරවල් කීයක් කෑවාද?

Cover Design by H. Pradeep Darshana, Ragama. Tel : 0772876280

ISBN 978-955-591-264-8

9 789555 912648

කුරුළු පොත් ප්‍රකාශකයෝ

594/1, නාවල පාර, රාජගිරිය දුරකථනය : 011-2863350/071-8263828

මිල රු. 200/=